## 449 පායන තරු පෙළ

පායන තරු පෙළ පරදා දිලිසෙන
අමුතුම තරුවක් පායන්නේ
අඳුරු වූ නෙත් බැඳි දහමින් ඔප කළ
සාමයෙ කුමරෙක් බිහිවන්නේ
අමුතුම තරුවක් පායන්නේ

බැඳි පෙම් සෙනෙහස මුව රඳවාගෙන
මරිමවු උකුලේ සැතපෙන්නේ //
මෙත් කරුණා ගුණ වඩවා දම් සුව
සාමෙ පිණිස ජීවිත පිදුවේ
සාමෙ පිණිස ජීවිත පිදුවේ

සාමෙ සතුට ලොවටමැ ගෙන දෙන්නේ
අලුත් ලොවක් අද බිහිවන්නේ //
අපිත් ඔබත් හැම එකතු වෙලා
සාමයෙ පණිවුඩ ලොවට දෙමු
සාමයෙ පණිවුඩ බැබළේවා